# ලාංකේය සමාජ සංහිඳියාව උදෙසා ආගමික බහුවිධතාව පිළිගැනීමේ වැදගත්කම

ජී. එස්. චරිත් ප්‍රියදර්ශන[1]

## හැඳින්වීම

ආගම පොදු පුද්ගල සාධකයක් වශයෙන් ලාංකේය බහු ආගමික සමාජ සන්දර්භය තුළ විවිධත්වයෙන් යුතුව පවතිනු දැකිය හැකි ය. බෞද්ධ ආගම ඓතිහාසික වශයෙන් මූලික කොටගත් සිංහල බෞද්ධ ජන සමාජයත්, හින්දු ආගමික විශ්වාසයන් මූලික කොට ගත් දෙමළ ජන සමාජයත්, මුස්ලිම් ජනතාවගේ ආගමික ලබ්ධිය වශයෙන් ඉස්ලාම් ආගමත් පවතිනු දැකිය හැකි ය. ක්‍රිස්තියානි ආගම සිංහල හා දෙමළ ජන වර්ගයන්ගේ සුසංයෝගයක් තුළින් බෞද්ධ හින්දු ආගම් වලින් ව්‍යුක්තව වෙනම ම ආගමක් වශයෙන් ව්‍යාප්තව ඇත. මේ ආකාරයට ආගමික විවිධත්වයන්ගෙන් යුත් ලාංකේය සමාජ සන්දර්භයෙහි ආගමික මුහුණුවර හඳුනාගත හැකි ය. මෙලෙස ලාංකේය සමාජ සන්දර්භයෙහි ආගමික මුහුණුවර බහු ආගමික පසුබිමක් නියෝජනය කරන අතර මෙහි දී එම ආගම් තුළ අන්තර්ගත වන ආගමික ඉගැන්වීම් සහ දර්ශනයන් මූලික කොට ගෙන එක් ආගමක් තවත් ආගමකින් වෙනස්වන ආකාරය (Religious Diversity) හඳුනාගත හැකි ය. මෙලෙස සමාජ කොටස් වශයෙන් ආගම් ඇදහීමත්, ආගමික දෘෂ්ඨිකෝණයන්හී විවිධත්වයෙන් යුත් ආගම් කිහිපයක් එක් සමාජයක ස්ථාපිතව වෙන් වෙන් වශයෙන් ඇදහීමේ දී ප්‍රායෝගික වශයෙන් ආගමික සට්ටනයන් (Religious conflicts) ඇතිවීමේ ප්‍රවනතාවක් පවති යි.

## පර්යේෂණ අරමුණ සහ ක්‍රමවේදය

මෙම සමාජ පසුබිම තුළ ලංකාවේ ආගමික වශයෙන් පවත්නා ගැටලු කවරේ ද? යන්න අධ්‍යයනය කිරීමත්, බහු ආගමික සමාජයක් තුළ ආගමික බහුවිධතාවය පිළිගැනීමෙහි වැදගත්කම කවරේ ද? එතුළින් සමාජයේ ආගමික ගැටුම් නිරාකරණය කරගැනීමට ලැබෙන පිටිවහල කෙබඳු ද? සහ එයට අදාළ ප්‍රායෝගික පසුබිමට අවශ්‍යවන්නා වූ ක්‍රමවේදයන් කවරේ ද? යන්නත් අධ්‍යයනය කිරීම මෙම පර්යේශණයෙහි මූලික අරමුණ වේ. මෙම පර්යේෂණයට අදාළ ව දත්ත එක්රැස් කිරීම ද්විත්යික මූලාශ්‍රය අධ්‍යයනයන් තුළින් හා සාමාජීය තොරතුරු ආශ්‍රය කරගනිමින් ගුණාත්මක ක්‍රමවේදය ඔස්සේ සිදුකරන ලදි.

---

[1] සමය අධ්‍යයන හා තුලනාත්මක දර්ශන අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, priyadarshana20@gmail.com

**සාකච්ඡාව සහ දත්ත විශ්ලේෂණය**

බහු ආගමික සමාජ සන්දර්භයක් තුළ ආගමික සහජීවනය (Co-existence) හෙවත් සමාජ සංහිඳියාව (Harmony) නම් වූ චින්තන විදිය ප්‍රායෝගික තලය තුළ ඉතා වැදගත් වන සාධකයකි. බෞද්ධ දාර්ශනික චින්තාවන්ගේ මූලික පදනම තුළින් ස්ථාපිතව ඇති ලාංකේය සිංහල බෞද්ධ ජන සමාජය ප්‍රධාන ජන වර්ගය ලෙසත් ඔවුන් අදහන ආගම ප්‍රධාන ආගම ලෙසත් ලාංකේය සමාජය තුළ ස්ථාපනය වී ඇත. හින්දු, ක්‍රිස්තියානි සහ ඉස්ලාම් යන දේවවාදී ආගමික පද්ධතීන් දෙවන ආගමික ස්තරය ලෙසත් ලාංකේය ජන සමාජයෙහි ස්ථාපිතව ඇත. මෙවැනි පසුබිමක් තුළ බහු ආගමික විශ්වාසයන්ට හා ඇදහිලිවලට ආගමික ස්වච්ඡන්දතාවයකින් යුතුව ස්ථාපනය වීමෙහි ලා බෞද්ධ ආගමික සමාජය තුළ පවතින ආගමික සහනශීලීත්වය ප්‍රධාන වී ඇත. එවන් පසුබිමක් තුළ ගොඩනැගෙන අනෙකුත් බෞද්ධ නොවන ආගම් ද ආගමික බහුවිධතාවයට (Religious Pluralism) ගරු කිරීම තුළින් හා අන්‍යයන්ගේ ආගමික අයිතීන්ට බලපෑමක් නොවන ආකාරයට තම ආගමික කටයුතු පවත්වාගෙන යාම තුළින් ආගමික සංහිඳියාව අපේක්ෂා කළ හැකි ය.

වර්තමාන ලාංකේය සමාජයෙහි ආගමික පසුබිම පිළිබඳ ව අධ්‍යයනය කිරීමේ දී ආගමික ගැටුම් ඇතිවීමේ නූතන ප්‍රවනතාවයක් දක්නට ඇත. බහු ආගමික සිරිත් විරිත් හා ඇදහිලි විශ්වාසවලින් යුත් ආගමික සමාජයක් පැවතීම රටක ආගමික වශයෙන් විවිධ වූ ජන සමාජයක සංහිඳියාව සහ සමාජීය පසුබිමෙහි නිරවුල් බව ආරක්ෂා කිරීමට වැදගත් වන්නා වූ සාධකයකි. එක් ආගමක් පමණක් අදහන අනෙකුත් ආගම් ඇදහීම සහ විශ්වාස කිරීම නෛතික වශයෙන් සීමා කොට පවතින අරාබි මුස්ලිම් ඉස්ලාමීය රාජ්‍යයන්හී ආගමික පසුබිම පිළිබඳ ව අධ්‍යයනය කිරීමේ දී, එම සමාජවල ආගමික මුහුණුවරකින් යුත් දරුණු ත්‍රස්තවාදී සංවිධාන (Religious Terrorism) බිහිවීම දක්වා බහුවිධ ආගමික පරිසරයක් නොපැවතීමේ සහ පිළිනොගැනීමේ ගැටලුව ව්‍යාප්තව ඇත. බහු ආගමික පරිසරයකට ඉඩ ප්‍රස්ථාව පවතින මැලේසියාව සිංගප්පූරුව වැනි රටවල් තුළ පවා පවතින ආගමික සම්ප්‍රධායන්ට පරිබාහිරව සමාජ උන්නතියට ඉවහල්වන්නා වූ නූතන ආගමික ප්‍රවනතාවයන්ට ඉඩකඩක් පැවතීමේ නිදහස් පසුබිම සකසා ඇත. ඒ තුළින් සාමාජීය වශයෙන් සහ චින්තනමය වශයෙන් වෙනස්වන පරිණාමය වන සමාජයන් තුළ අගමෙහි ද කාලීන භාවිතයන්ට අවශ්‍ය පසුහිම් ගොඩනැගීමට ඉඩප්‍රස්ථාව සැකසී තිබීම සහ බහු ආගමිකභාවය පිළිගැනීම තුළින් සමාජය තුළ හට ගන්නා ආගමික පීඩිත තත්වයන් මගහරවා සාමාජීය සහජීවනයට අවැසි පසුබිම ගොඩනගා ඇති බව දැකිය හැකි ය. මෙය බහු ආගමික සමාජයක් තුළ දැකිය හැකි වැදගත් ලක්ෂණයකි.

ආගමික අන්තවාදය (Religious Fundamentalism) නම් වූ ආගමෙහි පරිහානියට හෙවත් ආගමික උපයෝගීතාවයන්ගෙන් බැහැර වූ ක්‍රියාවලීන් ආගම විසින් ක්‍රියාත්මක කිරීම පොදුවේ ලෝකයටත් ලාංකේය සමාජයටත් බලපා තිබෙන ගැටලුවකි. ආගමික අනුගාමිකයින්ගේ සංඛ්‍යාව වැඩිකොට ගැනීමේ තරඟකාරීත්වය

ආගමික අන්තවාදයෙහි මූලික අරමුණ වේ. මෙම පසුබිමෙහි අවසානය ආගමික ත්‍රස්තවාදය වශයෙන් හඳුනාගත හැකි ය. ආගමික ඇදහීමෙන් ඔබ්බට ගොස් අසීමාන්තිකව ඒ ඒ ආගමික පද්ධතීන් සමාජය තුළ ක්‍රියාත්මක කිරීමට ආගම් විසින් උත්සාහ දැරීම තුළින් ලාංකේය ජන සමාජයට මෙන් ම එහි ඓතිහාසික සාධක මුල්කොටගත් සංස්කෘතික උරුමයන්ට සිදුවන්නා වූ හානිය (Cultural Deprivation) මෙහි එක් අයහපත් ප්‍රතිඵලයකි. බහු ආගමිකභාවය පිළිගැනීම තුළින් ලාංකේය සමාජයෙහි මුල්බැසගෙන පවත්නා සාම්ප්‍රදායික ආගම වන බුදු දහමේ සමාජ තත්වයට හා ස්ථාවරත්වයට හානි නොවන ලෙසත් පවතින සියලු ආගම් අන්තවාදය (Extremism), ත්‍රස්තවාදය (Terrorism) වැනි ආගමික නො වූ තත්වයන් ආගම තුළින් බැහැර කිරීමෙන් ආගමික බහුවිධතාවය පිළිගැනීමට අවැසිවන්නා වූ සමාජ පසුබිම ගොඩනගා ගැන්මට හැකි වනු ඇත.

ආගමික ගැටලුකාරී තත්වයන් පවතින සමාජයක් තුළ ආගමික බහුවිධතාවය තේරුම් ගැනීම වැදගත්වන්නා වූ සාධකයකි. පුද්ගලයාගේ මානව අයිතියක් ලෙස තමන් අදහන ආගම තුළ ජීවත් වීමට ඔහුට සදාචාරාත්මක අයිතියක් ඇත. එම අයිතිය භුක්තිවිඳින පුද්ගලයා තම භක්තිය පෙරටු කොට ගෙන තම ආගම අදහන්නාක් සේම, අන් අය ද ඒ ඒ පුද්ගලයන්ගේ ආගම පිළිබඳව භක්තිමත් වන බවත්, ඔවුනට ද තමන්ගේ ආගමික අයිතීන් ආරක්ෂා කරගැනීමට මෙන් ම එම අයිතීන් ආරක්ෂා වන පරිදි තමන් අදහන ආගම හා සම්බන්ධ කටයුතු පවත්වාගෙන යාම ආගමික බහුවිධතාවය පිළිගැනීම යන්නෙන් අදහස් කරයි. ඒ අනුව ආගමික බහුවිධතාවය පිළිබඳ ව ඉගැන්වීම් හා ඇගයීම් කරන, සාකච්ඡාවන සමාජයක් තුළින් ආගමික සංහිඳියාව ඇතිකර ගැනීමටත් රටක සාමාජීය වශයෙන් පැවතිය යුතු සාමය හා සහජීවනය ආරක්ෂා කරගැනීමටත් ප්‍රධාන ලෙස ම බලපාන බව පිළිගත් සමාජ සාධකයකි.

## නිගමනය

ආගමික බහුවිධතාවයෙහි වැදගත්කම පිළිගැනීමෙන් තොර සමාජයන් තුළ, බහුවිධතාවයන්ට ගරු කරන ආගමික පද්ධතීන් යටපත් කොට අන්තවාදී ආගමික සංස්ථාවන්ගේ නැගීමක් පැවතීම ලොකයේ දක්නට ඇති ප්‍රවනතාවයකි. මෙවැනි පසුබිමක් තුළ පොදුවේ සමස්ත සමාජ සන්දර්භයටම පිළිගත හැකි ආගමික බහුවිධතාවයට ගරු කිරීම වැනි සංකල්පයන් පිළිගෙන ක්‍රියාත්මක කිරීම තුළින් එක් ආගමක් හෝ සංස්කෘතියක් යටපත් කොට බිද දමා තවත් සංස්කෘතියක් ආගමක් නැගීසිටීම වෙනුවට ආගමික උපයෝගීතාවයන් තේරුම් ගනිමින් ඒ තුළ ජීවත් වීම ප්‍රායෝගික වශයෙන් වැදගත් වන්නා වූ සාධකයකි.

ලාංකේය ආගමික සන්දර්භයෙහි තරඟකාරීත්වයක් ගොඩනැගී එය අන්තවාදයක් දක්වා වර්ධනය වීමෙහි පසුබිම තුළ පුද්ගලයා ආගමෙහි උපයෝගීතාවය හා එහි හරය වටහා නොගැනීමේ ගැටලු ව හඳුනාගත හැකි ය. ආගමික සන්දර්භයක් තුළ පවත්නා දාර්ශනික විවරණයන්හී වැදගත්කම සහ සදාචාරාත්මක පසුබිම ප්‍රධාන වේ. පුද්ගල ආධ්‍යාත්මය මූලික කොටගෙන

ගොඩනැගෙන ආගම නම් වූ සාධකය පුද්ගලයාගේ සදාචාරාත්මක තලයෙහි සංවර්ධනය තුළින් පුද්ගලයා ආධ්‍යාත්මික තත්වයක් දක්වා රැගෙන යන්නා වූ මග පෙන්වීමක් සිදු කිරීම ආගමෙහි මූලික කාර්යභාරය වේ. එවැනි පසුබිමක් තුළ ආගමෙහි කාර්යභාරයන් අමතක කොට ආගම නම් වූ සාධකය පුද්ගලයාගේ ලෞකික තලයෙහි පරිහානිය කරා මෙහෙයවන්නක් නම්, ඒ තුළ ආගමෙහි ප්‍රයෝජ්‍යතාවය (Religious Pragmatism) අවබෝධකොට නොගැනීමේ ගැටලු ව පවතන බව පැහැදිලි ය. පුද්ගලයාගේ ප්‍රායෝගික අවශ්‍යතාවයන් සපුරමින් ආධ්‍යාත්මික පසුබිමක් කරා පුද්ගලයා මෙහෙයවීමේ සමාජ කාර්යභාරය විවිධ ආගම් තුළින් විවිධාකාරව අඩු වැඩි වශයෙන් අවබෝධ කොටගෙන දේශනා කරන බව පොදුවේ දැකිය හැකි ය. මෙවන් පසුබිමක් තුළ ලාංකේය සමාජයෙහි ආගමික සංහිඳියාව ගොඩනැගීමෙහි ලා ආගමික බහුවිධතාවය පිළිගැනීමත් ඒ සඳහා අධ්‍යාපන ක්‍රමවේදයන් හරහා මෙම පසුබිම පිළිබඳව න්‍යායාත්මක දැනුමක් ලබා දීම තුළින් සහ එම දැනුම ප්‍රායෝගික තලයෙහි ක්‍රියාත්මක කිරීම තුළින් ආගමික බහුවිධ තාවයට ගරුකරන සමාජයන් ගොඩනගා ගැනීමට හැකි වන බවත් එය ප්‍රායෝගික අවශ්‍යතාවය ලෙස වැදගත් වන බවටත් මේ තුළින් නිගමනය කළ හැකි ය.

ප්‍රමුක පදඃ ආගම, ආගමික ගැටුම්, බහුවිධතාවය පිළිගැනීම, සංහිඳියාව.

ආශ්‍රිත ග්‍රන්ථ

රාජපක්ෂ, පු. (2010). *ආගමික ත්‍රස්තවාදය.* කොළඹ 10ඃ සමයවර්ධන මුද්‍රණ ශිල්පියෝ.

Srivastava, R. (1996)' *Comparative Religion*' NewDelhi: Manshiram Manoharlalpublishers.

වජිර හිමි, ක., (2008), ''සාමය හා සමගිය සඳහා ආගමික චින්තන.'' *සමය අධ්‍යයන ශාස්ත්‍රීය සංග්‍රහය.* කොළඹ 10ඃ සමයවර්ධන මුද්‍රණශිල්පියෝ, පි. 15-18.

කුමාර, එන්. වී., හේමන්ත, පී. ඒ. (2011-2012). ''ආගම පිළිබඳ සමාජ හා මානව විද්‍යාත්මක පර්යාලෝක.''*සම්භාෂා 18 වැනි කලාපය. 2600 ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති සමරු කලාපය,* අධ්‍යාපන අමාත්‍යංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ ප්‍රකාශනයකි. පි. 225-242.

Padmasiri thero, R. (2015)' "Need for Addressing Conflicting Religious Teaching Instead of Surface Dialogues for a Long-lasting Religious Harmony", *Religious Tolerance and Harmony* (International conference Research Journal), Buddhist and Pali University of Sri Lanka. Pp. 23-36.